සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

43 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

## ක්‍රිස්තියානි ධර්මය I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. ශුද්ධ බයිබලය ප්‍රථමයෙන් හේබ්‍රෙව් හා අරමීය භාෂාවලින් ලියවුණු අතර පසුව ග්‍රීක හා ලතින් භාෂාවන්ට ද පරිවර්තනය විය. එම පිටපත් හඳුන්වන්නේ,

    i. මැසරොටික් හා වුල්ගාතා ලෙස.
    ii. සෙප්තුවාජින්ත හා වල්ගේට් ලෙස.
    iii. මැසරොටික් හා සෙප්තුවාජින්ත ලෙස.
    iv. බිබ්ලොස් හා වල්ගේට් ලෙස.
    v. බිබ්ලියොන් හා වල්ගේට් ලෙස.

02. අභිරහසක් වූ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේ "අනාවරණය වීම" යන වචනය සඳහා යෙදෙන ග්‍රීක පදය වන්නේ,

    i. තියෝනෙව්ටෝස්
    ii. සික්කරෝන්
    iii. ඇපොකලිප්ස්
    iv. සෙෆර් තෙහිලීම්
    v. රෙවෙලාරේ.

03. තිමති දෙවන ලිපියට අනුව දේව වචනය රචනා කිරීමේ එක් විශේෂ අරමුණක් වන්නේ,

    i. යකුන් දුරු කිරීමට.
    ii. යාච්ඤා කිරීමට.
    iii. දේව වචනය නොවෙනස්ව පවත්වා ගැනීමට.
    iv. දේව අනාවරණය ප්‍රකාශ කිරීමට.
    v. ඉගැන්වීමට.

04. සමාරියාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව පිහිටා තිබූ සමරිතානුවන්ට අතිශය වැදගත් වූ ස්ථානයක් වන්නේ,

    i. එලියා දිවැසිවරයා හා බාල් පූජක ගැටුම සිදු වූ කාර්මෙල් කන්ද.
    ii. දේව මාළිගාවක් සහිත ගෙරසීම් කන්ද
    iii. මාර්තා හා මරියාගේ ගම වූ බෙතානිය.
    iv. ක්‍රිස්තුන් වහන්සේ පළමු ප්‍රාතිහාර්ය සිදු කළ කානානුවර.
    v. දාවිත් රජතුමාට අභිෂේක කළ හේබ්‍රොන්.



මෙම ප්‍රශ්න පත්‍ර, සියලුම සොබකරණය ක්‍රමවේද අනුගමනය කරමින් සොබක අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

05. හෙබ්‍රෙව් ජාතිකයෙකු වුවද, ජෝශප්ට මිසරයේ දේශාධිපති වීමට හැකියාව ලැබුණේ.

i. හික්සෝස් ජාතික පාරාවෝ රජුගේ ආරාධනාව නිසා.

ii. පළමු වන අහ්මොස් හික්සෝස්වරුන්ව මිසරයෙන් පන්නා දැමූ නිසා.

iii. විජාතිකයෙකු අනිවාර්යෙන් මෙම තනතුරට පත් විය යුතු නිසා.

iv. ජාකොබ්ගේ පෙළපතට මිසරයේ පුරවැසිභාවය තිබූ නිසා.

v. ජෝශප් ද සෙමතික් ජනවර්ගයට අයිති වූ නිසා.

06. කතෝලික සන්දේශවල නම් පමණක් සහිත පිළිතුර වන්නේ,

i. I පේදුරු, I ජොහාන්, ජාකොබ්, ජුද්.

ii. ගලාති, පිලිප්පි, I පේදුරු, ජාකොබ්

iii. රෝම, කොලොස්සි, I තිමති, II තිමති

iv. තීතස්, එපීස, I තෙසලෝනික, රෝම

v. I ජොහාන්, I තිමති, පිලිප්පි, තීතස්

07. පර්සියානු සමයේ දී රට පාලනය කිරීම සිදු කළේ,

i. අධිරාජ්‍යයා විසිනි.

ii. ආණ්ඩුකාරයා විසිනි.

iii. නායක පූජකයා විසිනි.

iv. යුව රජු විසිනි.

v. සද්දුසිවරුන් විසිනි.

08. එලොහිම් සම්ප්‍රදායට අනුව ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට රැගෙන යාමට කැඳවීම බාරගත් මෝසෙස්තුමා,

i. ජනනායකයෙකි.

ii. දිවැසිවරයෙකි.

iii. වීරවරයෙකි.

iv. රජ කෙනෙකි.

v. පූජකවරයෙකි.

09. ඉශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ හා ඇති කරගත් ගිවිසුම, පාස්කු ජනවන්දනාවේ අර්ථ නිරූපණය වන්නේ,

i. නුමුහුන් පුප අනුභව කිරීම මගිනි.

ii. තිත්ත පලා අනුභව කිරීමෙනි.

iii. පාස්කු බැටළුවා භෝජනයට ගැනීමෙනි.

iv. මිදියුෂ පානය කිරීමෙනි.

v. උළුවස්සේ ලේ තැවරීමෙනි.

10. ''මිනිසා වැටි පිඩකින් නිර්මාණය කළ දෙවියන් වහන්සේ කුඹලුකරුවෙකු ය'' යන සංකල්පය ඉදිරිපත් කරන්නේ,

i. යාවේ සම්ප්‍රදාය තුළ.

ii එලොහිම් සම්ප්‍රදාය තුළ

iii. ද්විතීය නීති සම්ප්‍රදාය තුළ.

iv. පූජක සම්ප්‍රදාය තුළ

v. වාචික සම්ප්‍රදාය තුළ

11. උත්පත්ති පොතේ දක්වන ''ජීවන වෘක්ෂය'' පිළිබඳ කතාවේ සැකැස්ම,

i. ශුද්ධ බයිබලීය සංකල්පයකි.

ii. අමරණීයත්වය හඟවන මැදපෙරදිග සංකේතයකි.

iii. සශ්‍රීකත්වය සංකේතවත් කරන බැබිලෝනියානු සංකල්පයකි.

iv. සදාචාරයේ ආධිපත්‍යය පිළිබඳව කියවෙන අසිරියානු කතා පුවතකි.

v. නපුරේ බලවේගය ගැන කියවෙන සුමේරියානු කතා පුවතකි.



මෙම ප්‍රශ්න පත්‍ර, සියලුම සොබසරණිය ගුණමේද අනුගමනය කරමින් සොබස අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකේජ් කිරීම් හා බෙදාහැරීම් සිදුකර ඇත.

12. සීන් නමැති පාළුකරයෙන් නික්මුණු ඉශ්‍රායෙල් ජනතාව ඉන්පසුව කඳවුරු බැඳගෙන නවාතැන් ගත්තේ,

i. රෙපිඩීම් නම් ස්ථානයේ. ii. මස්සා නම් ස්ථානයේ. iii. මාරා නමැති ස්ථානයේ.
iv. දාන් නම් ස්ථානයේ. v. ෂෙකෙම් නම් ස්ථානයේ.

13. මෝසෙස්තුමා සමඟ සීනයි කන්දට නැඟී ප්‍රජා මූලිකයන් හැත්තෑ දෙනා හැරුණු කොට ඉතිරි තිදෙනා වන්නේ,

i. ජෝෂුවා, ආරොන් හා නාදාබ්. ii. දාන්, ආෂෙර් හා සාඹුලොන්.
iii. ජුදා, ඉස්සාකර් හා ජෝෂුවා. iv. අබිහුම්, නාදාබ් හා එළියා.
v. ආරොන්, නාදාබ් හා අබිහුම්.

14. යුක්ති සහගතව හා නිවැරදිව ජීවිතයට මුහුණ දීමේ හැකියාව හේබ්‍රෙව් භාෂාවෙන් හඳුන්වනු ලබන්නේ,

i. එව්ඇන්ජලියොන් ලෙස. ii. හොක්මා ලෙස. iii. හෙසෙඩ් ලෙස.
iv. කෙරිග්මා ලෙස. v. බෙසෝරා ලෙස.

15. දෙවියන් වහන්සේ මහිමාන්විතව දේව මාළිගාවේ වැඩ සිටින බව දකිමින් කැඳවීම ලැබූ දිවැසිවරයා වන්නේ,

i. යෙසාය. ii. ජෙරමියා. iii. එසකියෙල් iv. හොසියා. v. ආමෝස්.

16. රාජ්‍ය පාලනයට සුදුසුකම් ලැබූ හා රාජ්‍ය සභාවේ සේවකයින් පුහුණු කිරීම සඳහා යොදාගත් ඉගැන්වීම් හඳුන්වන්නේ,

i. විනයධරයන්ගේ ප්‍රඥාව නමිනි. ii. සෙබයිට් ප්‍රඥාව නමිනි.
iii. මෙසපොතේමියානු ප්‍රඥාව නමිනි. iv. අභිධාර්මික ප්‍රඥාව නමිනි.
v. ප්‍රායෝගික ප්‍රඥාව නමිනි.

17. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසුව ආගමික කටයුතු සිදු කිරීමට ඉදි කරන ලද ආගමික ස්ථානය හඳුන්වන්නේ,

i. සිනගෝගය ලෙසිනි. ii. සැන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාව ලෙසිනි.
iii. ජුදා අධිකරණය ලෙසිනි. iv. අති ශුද්ධස්ථානය ලෙසිනි.
v. සේනාකුළු ශාලාව ලෙසිනි.

18. දේව මාළිගාවේ ආගමික නායකත්වය දරන උත්තම පූජක තනතුරට පත් කරන ලද්දේ මෙම ආගමික කණ්ඩායමෙන් කෙනෙකි.,

i. සද්දූසිවරු ii. සෙලෙට්වරු iii. එසේනිවරු iv. පරිසිවරු v. විනයධවරු

19. පුරාණ ජනවන්දනා කටයුතු හේතු කර ගනිමින් ගීතිකා බිහි වූ බවට අදහස් දක්වන්නේ,

i. ආතර් වයිසර් ය. ii. සිග්මන් මොවින්කල් ය. iii. හර්මන් ගුන්කල් ය.
iv. ජුලියස් වෙල්හවුසන් ය. v. එච්. ක්වෙන්

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකේජ් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

20. පෙරුසලමේ ශ්‍රී විභූතිය ගැන කියවෙන ප්‍රශංසා ගීත හඳුන්වන්නේ,

i. ප්‍රශංසා ගීත නමිනි. ii. තුති දීමේ ගීත නමිනි. iii. ප්‍රඥාගීත නමිනි.
iv. වන්දනා ගීත නමිනි. v. විශ්වාසයේ ගීත නමිනි.

21. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ යුවරජ කෙනෙකුව සිටි හෙරෝද් ඇන්ටිපස් හට භාරව තිබූ ප්‍රදේශ වන්නේ,

i. ජුදයාව හා සමාරිය. ii. ගලීලය හා සමාරිය. iii. සමාරිය හා ගලීලය.
iv. ඉදුමිය හා ජුදයාව. v. ගලීලය හා පෙරයාව.

22. ''පාරාවෝ වෙත යාමටත් ඉශ්‍රායෙල් ජනයා මිසරයෙන් පිටතට ගෙන යාමටත් මම කවරෙක් දැ'' යි (නික්ම 3/11) අසන මෝසෙස්තුමාව, දෙවියන් වහන්සේ දිරිමත් කරනු ලබන්නේ.

i. හාස්කම් පෑමේ බලය ලබා දීමෙනි.
ii. ''නුඹ කිව යුතු දේ මම නුඹට කියා දෙමියි'' වදාරමිනි.
iii. ''ස්වයම්භූ නම් තැනැන් වහන්සේ එවූ බවට පවසන්නට උපදෙස් දෙමිනි.
iv. ''ආරොන් සමග යන්නැ'' යි ප්‍රකාශ කරමිනි.
v. ''මම නුඹ සමඟ සිටිමි'' යි වදාරමිනි.

23. සීනයි ගිවිසුම ස්ථිර කිරීමේ දෙවන අදියරේ දී මුලින් ම ඉටු කළ පිළිවෙත වන්නේ,

i. මරන ලද සතාගේ රුධිරය පූජාසනය මත ඉසීම.
ii. ගිවිසුම ශබ්ද නගා කියවීම.
iii. ජනතාව මත රුධිරය ඉසීම.
iv. ආඥා හා නියෝග ඉටු කරන බවට ජනතාව ප්‍රතිඥා දීම.
v. මෝසෙස්තුමා විසින් ආඥා හා නියෝග ලියා තැබීම.

24. ආදිපිය ආබ්‍රහම්තුමාට දුන් පොරොන්දු නැවතත් ජාකොබ්මගින් අලුත් කරනු ලබන්නේ,

i. හරාන්වල දී. ii. හේබ්‍රොන්වලදී iii. බෙයර්ෂෙබාහි දී. iv. බෙතෙල්හි දී
v. පෙනුයෙල්හි දී

25. මෝසෙස්තුමා අත් ඉහළට ඔසවා ගෙන යාච්ඤා කරන තාක් ජය අත් වූයේ,

i. කානානිවරු සමග සටනේ දී. ii. හිත්තිවරු සමග සටනේදී.
iii. ජෙබුසිවරු සමග සටනේ දී. iv. පිලිස්තිවරු සමග සටනේ දී
v. අමෙලෙක්වරු සමග සටනේ දී.

26. යෙසායා 61, 1 අනුව ගැලවීමේ සුබාරංචිය හිමි අය වන්නේ,

i. රජුන්, දිවැසිවරුන්, ඊශ්‍රායෙල් පුත්‍රයන්
ii. විනිසකරුවන්, අධිපතිවරුන්, ජුදා නායකයන්
iii. මහල්ලන්, බාලයන්, සැදැහැවතුන්
iv. දිළින්දන්, වහලුන්, සිරකරුවන්
v. බිඳුනු සිතැත්තන්, ඊශ්‍රායෙල් රජවරුන්, දමිටුවන්.

NWP - EXAM


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

27. ශු. මතෙව් සුබාරංචියෙහි, ශු බයිබලයේ පංච පුස්තකයට සමාන්තරව ඇති දේශනා පහෙන් තෙවන දේශනය වන්නේ,

i. කන්ද උඩ දේශනය.

ii. ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා උපමා.

iii. ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා අවසාන විනිශ්චය ගැන දෙසුම.

iv. ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා ප්‍රජාව ගැන දෙසුම.

v. ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා මෙහෙය ගැන දෙසුම.

28. ශු.මාක් සුබාරංචියේ කතෘ පේදුරු තුමාගේ සහායක හා භාෂා පරිවර්තන මාර්ක් නැමැත්තකු බව පෙන්වාදෙන සභා පියවරු වන්නේ,

i. පැපියස් තුමා, ඉරනේයස් තුමා, ඔරිගන් තුමා

ii. ටර්ටුලියන් තුමා, ජෙරොම් තුමා, එව්සේබියස් තුමා.

iii. සිරිල් තුමා, අගුස්තීනු තුමා, බැසිල් තුමා.

iv. අතනාසියුස් තුමා, අම්බ්‍රෝස්තුමා, පොලිකාප් තුමා

v. හර්මස් තුමා, ක්ලෙමෙන්ට් තුමා, ජෝන් ක්‍රිසොස්තම් තුමා

29. සමදර්ශක සුබාරංචි තුන හා ජොහාන් සුබාරංචිය යන සියල්ලම වාර්තා කරන ප්‍රාතිහාර්යය දෙකක් වන්නේ,

i. අංශභාග රෝගියා සුව කිරීම, අශුද්ධාත්ම වූවකු සුව කිරීම.

ii. කතා නුවර ජලය මිදියුෂට හැරවීම, කුණාටුව සංසිඳවීම.

iii. ලාසරස්මරණින් උත්ථාන කිරීම, භාරදහසකට කෑම දීම.

iv. ලාදුරු රෝගීන් දස දෙනෙකු සුවපත් කිරීම, ජාත්‍යන්ධයකුට පෙනීම දීම.

v. පන්දහසකට කෑම දීම, මුහුද මත ඇවිදීම.

30. කොරින්තියේ ධර්මදූත සේවයේ යෙදෙන අතර ශු. පාවුලු තුමා සමග කූඩාරම් කර්මාන්තයේ යෙදුණු යුවල වන්නේ,

i. අනනියස් හා සපිරා

ii. යුතිකස් හා ලිදියා

iii. අකිලා හා ප්‍රිස්කිලා

iv. ජුස්තස් හා අකිලා

v. තීතස් හා ලිදියා.

31. පාවුලු හා බාර්ණබස් විසින්, උපන් දා සිට කොර මිනිසකු සුවපත් කළ ප්‍රදේශය වන්නේ,

i. ඉකෝනිය.

ii. දර්බය.

iii. පිසිදියේ අන්තියෝකිය.

iv. ලුස්ත්‍රාව.

v. සිලුකිය.

32. ශු. පාවුලු තුමාගේ සංදේශ කාලය අනුව, වර්ගීකරණයේදී ක්‍රි.ව. 61 - 63 අතර ලියැවුණු සංදේශ දෙකක් වන්නේ,

i. පිලිප්පි, එපීස.

ii. තීතස්, 1 තිමෝති

iii. I තෙසලෝනික, II තෙසලෝනික.

iv. ගලාති, රෝම

v. කොලොස්සි, 1 කොරින්ති

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර, සියලුම සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

33. ශු පාවුලු තුමා පිලමොන්ට ලියන ලද හසුනේ තේමාව වන්නේ,

i. දේශීය සභාවල පාලනය සංවිධානාත්මකව පවත්වාගෙන යාම අවශ්‍ය බව.

ii. ඉවසීමෙන් දූත කාර්යයේ යෙදිය යුතු බව.

iii. දේශීය සභාවල පාලනය හා සංවිධානය.

iv. ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය දැන්ම සිදු නොවන බව.

v. ඔනේසිමස් වහලකු නොවන බව දැක්වීම.

34. දැල පිළිබඳ උපමාවෙන් උගන්වන පණිවිඩය වන්නේ,

i. දේව රාජ්‍යය සුළුවෙන් හා අදෘශ්‍යමාන ලෙස ආරම්භ වන නමුත් කල්යත්ම එය ප්‍රකාශයට පත්වන බවයි.

ii. අපගේ ක්ෂණික වූත් පරිත්‍යාගශීලීවූත් ප්‍රතිචාරය ඉල්ලා සිටීමයි.

iii. දේව රාජ්‍යය ඉතා සියුම්ව හා කෙමෙන් වර්ධනය වන බවයි.

iv. අවසානයේදී දමිටුවන්ගෙන් අදමිටුවන් වෙන්කර ඒ ඒ අයට සුදුසු විපාක දෙන බවයි.

v. දැහැමි දෙවි කෙනෙකුගේ පාලනය යටතේ ඇති ලෝකයේ දුදනන් වැජඹෙන බවයි.

35. ජේසුස් වහන්සේගේ දුක්විඳීමට හේතුව වන්නේ,

i. එය උන්වහන්සේගේ ඉරණමෙහි බලපෑමකි.

ii. නායක පූජකයින්ගේ සැලැස්ම නිසා සිදු වූවකි.

iii. ජුදාස්ගේ පාවා දීම නිසා සිදු වූවකි.

iv. ලෝකය ගලවා ගැනීමට වූ දේව සැලැස්මකි.

v. පිලාත්ගේ බලය විදහා පෑමට සිදු වූවකි.

36. ශු මතෙව් තුමා ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියෙහි පිලාත්ගේ භාර්යාව හා සම්බන්ධ සිහිනය උපයෝගී කරගෙන ඇත්තේ,

i. පිලාත්ගේ තීරණ වගකීමෙන් තොර බව පෙන්වීමටයි.

ii. දේව මඟ පෙන්වීම දැක්වීමේ මාර්ගයක් ලෙසයි.

iii. පිලාත් හට මරණ දඬුවම දීමට බලයක් ඇති බව ඇඟවීමටයි.

iv. පිලාත්ගේ තීරණ සිය භාර්යාව මත රඳා ඇති බව පෙන්වීමටයි.

v. ජුදෙව්වන් මඟින් දේව අපහාසයක් සිදුවන බව පෙන්වීමටයි.

37. ''ක්‍රිස්තුන් ස්වාමීන් වහන්ස මාගේ ආත්මය පිළිගත මැනව'' කියා තම මරණය ඉදිරියේ යාච්ඤා කළ පුද්ගලයා වන්නේ,

i. මහා ජාකොබ්. ii. කොර්නේලියස්. iii. ස්තේපන්.

iv. මායාකාර සීමෝන් v. උපස්ථායක පිලිප්.

38. කිතුනුවන්ට එරහිව පීඩාවක් ඇරඹූ ප්‍රථම රෝම අධිරාජ්‍යයා වන්නේ,

i. ඩොමීෂියන් අධිරාජ්‍යයා ii. මාකස් අවුරේලියස් අධිරාජ්‍යයා. iii. ට්‍රාජන් අධිරාජ්‍යයා.

iv. ඩෙසියස් අධිරාජ්‍යයා v. නීරෝ අධිරාජ්‍යයා

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර, සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

39. හත්වන පීඩන සමයේදී ප්‍රාණ පරිත්‍යාගි වූ පුද්ගලයන් දෙදෙනෙකු වන්නේ,

i. ශු. අගතා තුමිය, ශු. ඇලෙක්සැන්ඩර්තුමා.

ii. ශු. අයිරේයස් තුමා, ශු. පර්පචුවා තුමිය.

iii. ශු. ලෝරන්ස් තුමා, ශු. ෆේබියන් තුමා.

iv. ශු. ඇග්නස් තුමිය, ශු.ලුසියා තුමිය.

v. ශු. සෙබස්තියන් තුමා, ශු. ඉග්නේෂස් තුමා.

40. සභා පියවරුන් අතර ලතින් සභා පියවරු දෙදෙනෙක් වන්නේ,

i. මහා බැසිල් තුමා, අතනාසියුස් තුමා

ii. නසියන්ස්හි ග්‍රෙගරි තුමා, ජෙරොම් තුමා

iii. අම්බ්‍රෝස් තුමා, අගුස්තීනු තුමා

iv. ජෝන් ක්‍රිසොස්තම් තුමා, මහා ග්‍රෙගරි තුමා

v. මහා බැසිල්තුමා, මහා ග්‍රෙගරි තුමා

41. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය වැළඳීමේදී සිදු වන අක්‍රමිකතා ශු. පාවුලු තුමා විසින් දැඩි දෝෂ දර්ශනයට ලක් කරන සංඝය වන්නේ,

i. කොරින්ති සංඝය

ii. ගලාති සංඝය

iii. එපීස සංඝය

iv. රෝම සංඝය

v. කොලොස්සි සංඝය

42. ''මා ඔබට ඉගැන්වූ මේ පිළිවෙත ම ස්වාමීන් වහන්සේගෙන්ම ලැබුවෙමි.'' යන ශු. පාවුලු තුමාගේ වදන් අවබෝධ කර ගත යුත්තේ,

i. ජේසුස් වහන්සේ ශු. පාවුලු තුමාට දර්ශනය වී වදාළ දෙයක් ලෙසිනි.

ii. ක්‍රිස්තුන් වහන්සේ ස්වප්නයකින් කළ අනාවරණයක් ලෙසිනි.

iii. ශු. පාවුලු තුමා තමන් විසින් සිතාගත් දෙයක් ලෙසිනි.

iv. පාවුලු තුමාට ගමාලියෙල් ඉගැන්වූ දෙයක් ලෙසිනි.

v. අපෝස්තුලුවරු පිහිටවූ සභාවක ජනවන්දනාවෙන් ලද දෙයක් ලෙසිනි.

43. විවිධ ක්ෂේත්‍රවල අප එඬේරුන් ලෙස කටයුතු කරන විට අපගේ වගකීම වන්නේ,

i. අප ඉන්නා ක්ෂේත්‍රයේ නායකයන් ලෙස වැජඹීමයි.

ii. හැකිතාක් තනතුරෙන් ප්‍රයෝජන ලබා ගැනීමයි.

iii. තම නාමය රක්ෂා කිරීම පිණිස වගකීම් බාර නොගැනීමයි.

iv. සේවය ලබන අය වෙනුවෙන් පූජා වීමයි.

v. සේවය ලබන්නන්ගෙන් සැලකුම් ලැබීමයි.

44. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර අසහාය මැදිහත්කරුවාණන් ක්‍රිස්තුන් වහන්සේ බව සඳහන් කරන නව ගිවිසුමෙහි ලිපිය වන්නේ,

i. ජාකොබ්

ii. I කොරින්ති

iii. I පේදුරු

iv. II ජොහාන්

v. හෙබ්‍රෙව්

45. ''නතානියෙල්'' යන නමින්ද හැඳින්වූ ජේසුස් වහන්සේගේ ගෝලයකු වන්නේ,

i. මතෙව්

ii. පිලිප්

iii. බර්තලමෙව්

iv. තෝමස්

v. සීමෝන්

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

46. සත්වාර සැත්තෑවක් සමාව දීම යනුවෙන් අදහස් කරනුයේ,

i. හත, හැත්තෑව යන සංඛ්‍යා ජුදෙව්වරුන්ට වැදගත් බවයි.

ii. එපමණ වර සමාව දීම තුළින් එකට එක කළ යුතු බවයි.

iii. සමාව දීම තුළින් පහත් තත්ත්වයට පත්වන බවයි.

iv. සමාව දීමට සීමාවන් ඇති බවයි.

v. සමාව දීම සීමා රහිතව කළ යුතු බවයි.

47. යුගාන්තය පිළිබඳ දේශනා තුළ අඩංගු උපමා දෙකක් වන්නේ,

i. නිධානය, වපුරන්නා

ii. අත්තික්කා ගස, දාසයන් තිදෙනා

iii. යුවතියන් දස දෙනා, කිරිඳි හා තිරිඟු

iv. නැතිවූ බැටළුවා, ස්ත්‍රීන් දෙදෙනා

v. දැල, මුහුන්

48. ජේසුස් වහන්සේ ගෝලයින්ට බලය දී පිටත් කර හරිනු ලබන්නේ,

i. ඉගැන්වීමට, දුර්මත දුරු කිරීමට, සුව කිරීම.

ii. සුව කිරීමට, සහනාධාර කටයුතු වලට, යකුන් දුරු කිරීමට.

iii. ඉගැන්වීමට, සුව කිරීමට, අශුද්ධාත්ම දුරු කිරීමට.

iv. පිළිවෙත් කිරීමට, ඉගැන්වීමට, මිනිසුන් රැස් කිරීමට

v. උපදෙස් දීමට, දුර්මත දුරු කිරීමට, සහනාධාර බෙදීමට.

49. මුල් යුගයේ දී කිතුනු ලේඛකයෙකු සහා පියෙකු වශයෙන් නම් කිරීමේදී සළකා බැලූ කරුණු දෙකක් වන්නේ,

i. ලියූ ග්‍රන්ථ සංඛ්‍යාව, ජීවත් වූ කාල වකවානුව.

ii. නියෝජනය කළ ගුරු කුලය, ශුද්ධවත් ජීවිතය

iii. තර්ක කිරීමේ ස්වභාවය, මන්ත්‍රණ සභා වලට සහභාගිත්වය.

iv. අපෝස්තුලුවරුන්ට ඇති සම්බන්ධතාවය, ලියූ ලිපි සංඛ්‍යාව.

v. ඉදිරිපත් කළ ධර්මයේ නිවැරදි බව, ශු.සභාවේ අනුමැතිය.

50. තේවාචාර්ය වරුන් සමාජ සේවාව සඳහා පත්ව සිටි නමුත් ඔවුන් අතරින් සුබ අස්න දේශනා කිරීමට හා බෞතිස්ම ස්තාපනයට යොමු වූ දෙදෙනකු වන්නේ,

i. ස්තේපන්, ප්‍රොකොරස්

ii. නිකනෝර්, තීමොන්

iii. පිල්ප්, පර්මෙනස්

iv. පර්මෙනස්, නිකාලොස්

v. ස්තේපන්, පිලිප්

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර, සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**43 S II**

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# ක්‍රිස්තියානි ධර්මය II

කාලය පැය තුනයි

## I කොටස

01. i. පලස්තීනයේ දක්නට ලැබෙන භූවිෂමතා දෙකක් සඳහන් කරන්න.

ii. එස්ඩ්‍රාලෝන් තැනිතලාව හා ජේසුස් වහන්සේගේ ජීවිතය සම්බන්ධ සිද්ධීන් දෙකක් ලියන්න.

iii. ජුදා කඳුකර ප්‍රදේශය කිතුනු අපට වැදගත් වීමට හේතු වූ කරුණු තුනක් ලියන්න.

iv. ශුද්ධ බයිබලය අධ්‍යයනය කිරීම සඳහා කිතුනු අපට පලස්තීනයේ භූගෝලීය පසුබිම අධ්‍යයනය කිරීමේ වැදගත්කම කරුණු හතරකින් පෙන්වන්න. (ලකුණු 2 + 4 + 6 + 8 = 20)

02. i. ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූපයන් දෙකක් නම් කරන්න.

ii. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද හතරක් සඳහන් කරන්න.

iii. ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධානතම අරමුණු තුනක් ලියන්න.

iv. එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන අවස්ථාවලදී ඔබ ප්‍රඥාවන්තයකු ලෙස කටයුතු කළ අවස්ථා හතරක් ලියන්න.

(ලකුණු 2 + 4 + 6 + 8 = 20)

03. i. ජේසුස් වහන්සේගේ බෞතීස්මය පිළිබඳ (මාක් 1 /11) ට අනුව ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි. යන පාඨය පුරාණ ගිවිසුමෙන් උපුටාගත් ග්‍රන්ථ දෙක ලියන්න.

ii. සේවය හා දුක් විඳීම තුළින් රජෙකු වීමට කැඳවීම ලැබූ ජේසුස් වහන්සේ බෞතීස්මය ස්නාපනය ලබා පාළුකරයට ගිය සේක. එහිදී උන්වහන්සේ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.

iii. ගිහියන් වන අප ප්‍රසාද ස්නාපන කැඳවීම තුළ දී කිතුනු අපගේ කාර්යභාරයන් තුන ලියන්න.

iv. ඉහත ඔබ සඳහන් කළ කාර්යභාරය ක්‍රියාවට නංවන අයුරු කරුණු හතරකින් පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 4 + 6 + 8 = 20)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## II කොටස

04\. i. ස්වාමීන් වහන්සේගේ සේවකයා යන සංකල්පය යෙසායා දිවැසිවරයා ඉදිරිපත් කරන දුක් විඳින සේවකයා සතු ලක්‍ෂණ පහක් ඔස්සේ විස්තර කරන්න.

ii. දුක් විඳින සේවකයාගේ ලක්ෂණ ආදර්ශයට ගනිමින් තම සේවය තුළ ප්‍රඥාවන්තව කටයුතු කරන ආකාරය කරුණු පහක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 10 x 2 = 20)

05\. i. පළමු මැවීමේ කතාව තුළින් මැවීමේ ක්‍රියාවලියේ උච්චස්ථානය මිනිසා හා ස්ත්‍රී මැවීම බව ප්‍රකාශ වෙයි. මෙය බයිබල් කතුවරයා පෙන්වා දෙන සුවිශේෂ කරුණු පහක් ඔස්සේ පැහැදිලි කරන්න.

ii. නූතන තාක්ෂණ දියුණුව ඔස්සේ හඹා යන ලෝකය තුළ ක්‍රියාකරන ආකාරය කරුණු පහක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 10 x 2 = 20)

06\. i. ශුද්ධ වූ පුවුළුතුමා පිලිප්පි සංඝයට ක්‍රිස්තුන් වහන්සේ ගේ බැහැපත්කම පැහැදිලි කරන ආකාර දෙක ලියා බැහැපත්කම හා කීකරුකම සමාජයේ ජීවත් වීමට අත්‍යවශ්‍ය ගුණාංගයක් බව පෙන්වා දෙන්න.

ii. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යයන් තුළ දිස්වන ප්‍රධාන කරුණු හතරක් ලියා ක්‍රිස්තුන් වහන්සේ ප්‍රාතිහාර්යන් කලේ සතර ආකාර වහල්කම් වලින් පීඩා විඳින ජනතාව ගලවා ගැනීමට බව උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 x 2 = 20)

07\. i. ජොහාන් සුවිශේෂය තුළ විශේෂත්වයක් වන ''මම වෙමි'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ස්වයං අනාවරණ ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. එවැනි ප්‍රකාශන පහක් ලියා සුභාරංචිය තුළ දිවිගෙවමින් තම දිවි පැවැත්ම අන් අයට ශුභාරංචියක් වනසේ ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

ii. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ පාලන බලය පිළිබඳ වැදගත් කරුණු පහක් ඔස්සේ විස්තර කර සැබෑ පාලකයකු ලෙස ක්‍රියා කිරීමට කළ යුතු දේ පෙන්වා දෙන්න. (ලකුණු 10 x 2 = 20)

08\. i. කිතුනු සභාවේ පීඩන සමය තුළ දිස් වූ විශේෂ ලක්‍ෂණ පහක් ලියා වර්තමාන කිතුනු සභාවට එල්ල වන අභියෝග ඉදිරියේ විශ්වාසය රැක ගනිමින් අභියෝග ජය ගැනීමට කළ යුතු දේ පැහැදිලි කරන්න.

ii. මිලාන් ආඥාව නිසා කිතුනුවන්ට නිදහස් යුගය උදාවිය. මෙය සනාථ කිරීමට කරුණු පහක් පෙන්වා දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 x 2 = 20)

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සොබාරගමුව ක්‍රමවේද අනුගමනය කරමින් පොඩිය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පොටෝ කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පළමු වාර පරීක්ෂණය - 2020

## ක්‍රිස්තියානි ධර්මය - 13 ශ්‍රේණිය.

## I පත්‍රය

## පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | II | 11. | II | 21. | V | 31. | IV | 41. | I |
| 2. | III | 12. | I | 22. | V | 32. | I | 42. | V |
| 3. | V | 13. | V | 23. | I | 33. | V | 43. | IV |
| 4. | II | 14. | II | 24. | IV | 34. | IV | 44. | V |
| 5. | V | 15. | I | 25. | V | 35. | IV | 45. | III |
| 6. | I | 16. | II | 26. | IV | 36. | II | 46. | V |
| 7. | III | 17. | I | 27. | II | 37. | III | 47. | II |
| 8. | II | 18. | I | 28. | I | 38. | V | 48. | III |
| 9. | III | 19. | III | 29. | V | 39. | I | 49. | V |
| 10. | I | 20. | IV | 30. | III | 40. | III | 50. | V |

(ලකුණු 2X50=100)

## ක්‍රිස්තියානි ධර්මය - 13 ශ්‍රේණිය.

## II පත්‍රය

### I කොටස

01. i. වෙරළබඩ තීරුව / බටහිර කඳු / ජෝර්දාන් මිටියාවත / නැගෙනහිර කඳු

ii. නායිම් නුවර වැන්දඹුවගේ පුතා උත්ථාන කිරීම / තාබෝර් කන්ද අන්‍යරූප විලාශය

iii. හෙබ්‍රොන් අවට ආබ්‍රහම් තුමා ජීවත් වීම / හෙබ්‍රොන්ට උතුරෙන් බෙත්ලෙහෙම ජේසුතුමාගේ උපත / බෙත්ලෙහෙමට උතුරින් ජෙරුසලම හි දේව මාලිගාව / ජෙරුසලමට නැගෙනහිරෙන් ඔලීව කන්ද පිහිටීම / ස්නාවක ජොහාන්ගේ උපත පුදා කඳුකරයේ සිදු වීම / ලාසරස් , මාර්තා හාමරියාගේ ගම බෙතානිය වීම.

iv. පලස්තීනය ඊශ්‍රායෙල් ජනතාවට දුන් පොරොන්දු දේශය බව / ජේසුස් වහන්සේ ජීවත් වූ සේවය කළ දේශය ශුද්ධ වූ දේශය බව / පලස්තීනයේ භූවිෂමතා හදුනා ගැනීම ජේසුස් වහන්සේගේ විශේෂ සිදුවීම් සම්බන්ධ වී ඇති බව / එහි ඇති ජන ජීවිතයන් හඳුනා ගැනීම / සාමාජීය, ආර්ථික, සංස්කෘතික තත්ත්වයන් දැන ගැනීම.

12 ශ්‍රේණි මාර්ගෝපදේශ 1.2 හි මට්ටම

(ලකුණු 2 + 4 + 6 + 8 = 20)

02. i. ප්‍රස්ථා පිරුළු / උපදෙස් / කියමන් / උපමා / ගීත / රූපාලංකාර / සංවාද

ii. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව / රාජ්‍ය සභාව හා ප්‍රඥාව / අභිධාර්මික ප්‍රඥාව / එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව

iii. ජීවිතය සාර්ථක ලෙසත් දැහැමි ලෙසත් ගෙවීමට ජනතාවට මඟපෙන්වීම / සමාජ පරිපාලනය හා ජීවිතයේ අරුත හා සීමාවන් අවබෝධ කර දීම / සමිඳුන්ට ප්‍රිය මනාප ලෙස අරුත්බර ජීවිතයක් ගත කිරීමට ප්‍රඥාව පිටුවහලක් වීම.

iv. සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

(12 ශ්‍රේණිය මාර්ගෝපදේශය 3.3. නි. මට්ටම)

(ලකුණු 2 + 4 + 6 + 8 = 20)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකේජ් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

03. i. ගීතාවලිය / යෙසායා

ii. * ගල් පාන්වලට හරවා සිය බලය ප්‍රදර්ශනය කිරීම තුලින් බලය ප්‍රකාශ වීම.

* දේව මාලිගාවේ කොත මුදුනෙන් පැන දේව දූතයන්ගේ සේවය ලබන තැනැත්තකු ලෙස කිර්තිය ලැබීම කිර්තිය ප්‍රකාශ වීම

* යක්ෂයාට වන්දනා කර සියලු රට රාජ්‍යයන් හිමිකර ගැනීම ධනය ප්‍රකාශ වේ.

මේවා තුලින් ඊශ්‍රායෙල් රජවරු බලය , කීර්තිය, ධනය මත තම රජකම ගොඩ නැගුබවත් ජේසුස් වහන්සේට හිමි රජකම තුල මේවා ප්‍රතික්ෂ්ප කළ යුතු බවයි.

iii. පූජක කාර්යභාරය / එඩේරික කාර්ය භාරය / දිවැසි කාර්යභාරය

iv. ඉහත සඳහන් කාර්යභාරයන්ට ගැලපෙන පරිදි පිළිතුරු සපයා ඇත්නම් ලකුණු දෙන්න.

(13 ශ්‍රේණිය මාර්ගෝපදේශය 6.1 නි. මට්ටම)

(ලකුණු 2 + 4 + 6 + 8 = 20)

## II කොටස

04. i. <u>දුක් විදින සේවකයා -</u>

දෙවියන් වහන්සේ සුවිශේෂ මෙහෙයක් සඳහා තෝරාගෙන ඇති බව.

පැවරී ඇති මෙහෙය සම්පූර්ණ කිරීම සඳහා දේවාත්මානුභාවය ලැබී ඇති බව

සේවකයා තම කාර්යය ඉටු කිරීම සඳහා හිංසාකාරී පියවරයන් නොගන්නා බව.

ජාතීන් උදෙසා මැදිහත් වන ඔහු අධෛර්යයට පත් නොවී යුක්තිය ඉටුවන තුරු ඉවසිලිවන්තව ක්‍රියාකරන බව.

සමිඳුන්ට විවෘතව සවන් දී තමන් අනාවරණය කර ගත්තා වූ වචනය තුළින් අන් අය ගොඩ නගන බව..

මෙවන් කරුණු ඔස්සේ ස්වාමීන් වහන්සේගේ සේවකයා දුක් විදින සේවකයකු බව විස්තර කර තිබීම.

ii. තමන් ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ සුවිශේෂ මෙහෙයකට කැඳවන බවත්,

පරිනත කිතුනුවකු වීම තුල ශුද්ධාත්ම දීමනා මගින් දේවාත්මානු භාවය ලබන බව අවබෝධ කර ගැනීම.

සේවය තුළ දී තමන්ට ලැබෙන අභියෝග ඉදිරියේ හිංසාකාරී ලෙස ක්‍රියා නොකිරීමට සිතීම.

අන් අය උදෙසා සේවය කරන විට අධෛර්ය නොවී ඉවසිලි වන්තව බලාපොරොත්තුවක් ඇතිව ක්‍රියා කිරීම.

බයිබලය තුලින් පිළිතුරු නිතරම සෙවීමට යොමු වීම තුල දේව අනාවරණය හඳුනා ගැනීම..

මෙවැනි කරුණු ඔස්සේ ප්‍රඥාවන්තව කටයුතු කළ අයුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 3.2 නි.මට්ටම)

(ලකුණු 10 x 2 = 20)

05. i. අපගේ ස්වරූපය අනුව අපගේ සමානත්වය ලෙස මිනිසා මැවූ බව

විවිධාකාර සත්ත්ව වර්ග සිටියද එකම මිනිස් වර්ගයක් ගැන පමණක් සඳහන් කිරීම.

දෙවියන්ගේ ස්වරූපය හා සමානකම දරන මිනිසා මේ ලෝකය තුළ දේව නියෝජිතයකු බවට පත් කිරීම.

දරු සම්පත් ලැබ වැඩි වර්ධනය වී පොළොව පුරා පැතිර එය යටත් කර ගැනීම.

මුහුදේ මසුන් කෙරෙහිද අහසේ පක්ෂීන් කෙරෙහිද පොළොවේ සැරිසරන සියලු සතුන් කෙරෙහිද බලය පැවැත්වීම.....

මෙවන් කරුණු ඔස්සේ පැහැදිලි කර තිබීම. (12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 2.2 න.මට්ටම.)

ii. සිසුන් ලියා ඇති කරුණුවල සාර්ථක බව සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 10 x2=20)

06. i. * ක්‍රිස්තුන් වහන්සේගේ දේව ස්වරූපය දැරූ නමුත් දේව සමානකම ත්‍යාජ කරමින් වහලෙකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මිනිසකු වීම තුළින් පෙන්වූ බැහැපත් කම.

* මනුෂ්‍යයා කාරයේ සිටිමින් උන් වහන්සේ කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වීම තුළින් හෙලිවන බැහැපත්කම.

දේවත්වය සම්පූර්ණයෙන්ම ත්‍යාජ කර මිනිස්කම තුල වහලෙකුගේ ස්වරූපය ගැනීම.

තමාගෙන් හිස් වූ බව පෙන්වා දීම සමාජයක ජීවත් වන විට බලය, කීර්තිය, ධනය තුල හිස්වීම තුළින් බැහැපත් වීම පෙන්ව දෙයි.

කීකරුකමේ විශිෂ්ඨත්වය කිතුනුවන්ට ලැබෙන්නෙ ක්‍රිස්තු ආදර්ශයෙනි. තම පියාණන් වහන්සේට උන්වහන්සේගේ අභිමතය පරිදි නින්දිත මරණයක් දක්වාම පහත් වී කීකරු වූ සේක. සමාජය තුල ජීවත් වන විට දේව සැලැස්මට හිස නමා දේව කැමැත්තට අවනතව කීකරුවීම කිතුනුකම බව පෙන්වා දෙයි.......... මෙවන් කරුණු ඔස්සේ පැහැදිලි කිරීම.

(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 5.2 නි. මට්ටම)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සොබපාරගමින කුම්වේද අනුගමනය කරමින් සොබප අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පකාට කිර්ම හා බෙදාහැරීම සිදුකර ඇත.

ii විශ්වාසය පසුබිම මත ක්‍රියාත්මක වේ. ක්‍රිස්තු පෞරුෂය ප්‍රකාශ වීම. දේව රාජ්‍යයේ උදාව සනිටුහන් වේ මනුෂ්‍යයන් වෙත දෙවියන් වහන්සේගේ දයා කරුණාව අනාවරණය වේ. සතර ආකාර වහල්කම් වලින් පීඩා විඳින අවස්ථා මරණය ලෙඩ රෝග ස්වාභාවික බලවේග හා දුෂ්ට ආත්ම වේ. ක්‍රිස්තුන් වහන්සේ ප්‍රාතිහාර්ය කලේ මේ සතර ආකාර වහල්කම් වලින් පීඩාවට පත් ජනතාව ගලවා ගැනීමටය. ක්‍රිස්තුන් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග හතර ලියා උදාහරණ දෙමින් පැහැදිලි කර තිබීම. 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 5.1 නි. මට්ටම.

(ලකුණු 10 x 2 = 20)

07. i. ජීවනදායක භෝජනය මම වෙමි. ලෝකයේ ආලෝකය මම වෙමි. බැටළුවන්ට දොරටුව මම වෙමි.

යහපත් බැටළු එඬේරා මම වෙමි. සැබෑ මිදි වැල මම වෙමි. මාර්ගයද සත්‍යයද ජීවිතයද මම වෙමි.

සුභාරංචියේ ආලෝකය තුළ ජීවිතය හැඩ ගස්වා ගැනීම සෑම කිතුනුවකුගේම වගකීම වෙයි.

වත්මන් කිතුනු පරපුරෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන්නේද එයයි.

සිසුවා අන් අයට ශුභාරංචියක් සේ ක්‍රියා කළ යුතු ආකාරය ලියා ඇති පරිදි ලකුණු ලබාදෙන්න.

12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 4.2 නි. මට්ටම.

ii. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තිනයේ පාලන බලය හිමි වූයේ රෝමවරුන්ටය.

ජුදයාව, සමාරිය හා ඉදුමිය පාලකයා වූයේ පොන්තියුස් පිලාත්ය.

ගලීලය හා පෙරයාව ප්‍රදේශය භාර වූයේ හෙරෝද් ඇන්ටිපස්ටය.

රෝම පාලන බලයට යටත් වූවත් ජුදෙව්වන්ට ආගමික නිදහස හිමි විය.

ආගමික මූලස්ථානය පෙරුසලම දේව මාලිගාව වූ අතර ආගමික නායකත්වය දැරුවේ උත්තම පූජකයාය

ජුදා ආගමික ගැටලු විසඳීම වූයේ ජුදා ශ්‍රේෂ්ඨාධිකරණ දීය. වරදකරුවන් කුරුස පත් කිරීම සිදු කළේ රෝම ආණ්ඩුකාරවරයාය.

ජුදා ජනතාවට රෝම අධිරාජයාට බදු ගෙවීමට සිදු විය. ඊට අමතරව දේව මාලිගා බද්දක්ද ගෙවිය. අධික බදු බර නිසා ජනතාව අධික සූරා කෑමකට ලක්විය.

සැබෑ නායකතුල තිබිය යුතු ගුණාංග නම් තම නායකත්වය තුළ පැවරෙන වගකීම් අවංකව ඉටු කිරීම.

තමන්ගෙන් සේවය ලබන පුරවැසියන්ට සාධාරණය ඉටු කිරීම.

පැසසුම් හා ගෞරවය මත සේවය නොකිරීම.

තම සේවය අවැසි සෑමවිටම සේවයට කැපවීම

පුරවැසි මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

පුරවැසි නිදහස ගරු කිරීම... මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 4.1 නි. මට්ටම)

(මුළු ලකුණු 10 x2=20)

08. i. අභියෝගවලට නිර්භයව මුහුණ දීම විශ්වාසය සුරැකීම සඳහා දැරූ ප්‍රයත්නය

අභියෝග හමුවේ විශ්වාසය සවිමත් වීම පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත් දැකීම

නිරතුරුවම විශ්වාසයට සාක්ෂි දැරීම පීඩා මාධ්‍යයේ විශ්වාසය හා කිතු දහම වර්ධනය වීම

අභියෝග ජය ගැනීමට හා විශ්වාසය රැක ගැනීමට ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

ii. තම අධිරාජ්‍යය තුල ආගම හැදෑරීමට සම්පූර්ණ නිදහස දීම පැහැරගත් ඉඩකඩම් නැවත ලබා දීම.

කිතුනුවන්ට විරුද්ධව පනවා තිබූ නීති අහෝසි කිරීම. සබත් දින ලෙස ඉරු දින නිවාඩු දිනයක් බවට පත් කිරීම.

කුරුස පත් කිරීමේ දඬුවම අවලංගු කිරීම. කිතුනු පූජකවරුන් අය බදු වලින් නිදහස් කිරීම.

13 ශ්‍රේණිය 1.2. නි. මට්ටම.

(ලකුණු 10 x2=20)


මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සොබපාරගමිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකේජ් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES




Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam



GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00



GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00